Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**

email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**



**සංස්කරණය / Editor**

අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**

ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**

ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**

අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**

ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**

Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත





## යාපනේ

මුල් වරට යාපනයට පා තබා වසර 37 ක් හා එල්ටීටීඊය පරාජය කර වසර දෙකහමාරකට පමණ පසු යළිත් වරක් අප පිටත්ව යන විට අප සිත්හි ප්‍රධාන වශයෙන් රැඳී තිබුණේ යුද්ධයෙන් පසු පසුගිය කාල සීමාව තුළ රටක් වශයෙන් කාලාන්තරයක් තිස්සේ දැවෙන ප්‍රධාන කගැටලුවට කෙසේ විසඳුම් දී ඇද්ද යන්න ගැන සැබෑ අවබෝධයක් ලබා ගලැනීමයි.

වවුනියාවේ සිට පුලියන්කුලම පරන්තන් පුදුමාතලේ පුදුකුඩිඉරුප්පු හරහා වෙල්ලමුල්ලිවයික්කාල් වලටද ඉන්පසු කිලිනොච්චි සිට අලිමංකඩ හරහා යාපනයටද නැවතත් කිලාලි කලපුව ඔස්සේ සංගුපිටි පාලම හරහා පුනරීන් වලටද පැමිණ ඒ9 මාර්ගයෙන් අවසන් වූ සම්පූර්ණ චාරිකාවේදී අප දුටු හා ලබූ අත්දැකීම් වල සාරාංශය නම් යුද්ධය අවසන් වී වසර දෙකහමාරක් ගතවී තිබුණද රටේ අංක එකේ ප්‍රශ්නයට රජය විසින් ප්‍රමාණවත් විසඳුමක් ලබා දී නැති බවයි. බොහෝ දෙනෙකුට මෙය රාජ්‍ය විරෝධී දේශද්‍රෝහී ප්‍රකාශයක් ලෙස අර්ථ දැක්විය හැකි නමුදු කණගාටුවෙන් වුවද අප ප්‍රකාශ කළ යුත්තේ සත්‍යය හා යතාර්ථයයි.

වසර 30ක යුද්ධය උතුරේ ජනතාවගෙන් බොහෝ දේ උදුරාගෙන තිබේ. යුද්ධය අවසන් වීමෙන් පසුවද මේ වන තෙක් ඔවුනට ප්‍රමාණවත් ආරක්ෂාවක් ලැබී නැත . ජීවත් වීමේ සිට කෑම් බීම් ඇඳුම් පැළඳුම් නිවාස ප්‍රශ්න විසඳීම කෙරෙහි ආණ්ඩුව දක්වන අසමත් භාවය උදාසීනාව නිසා ඔවුන් තුළ ආණ්ඩුව කෙරෙහි ඇත්තේ ප්‍රබල කළකිරීමක් බව ඔවුන් හා කළ සංවාද වලදී අපට අවබෝධ විය. රජය රජයට පක්ෂපාත මාධ්‍ය හා වන්දිභට්ටයන් කෙතරම් ප්‍රලාප දකුණට ඇදබෑවද උතුරු වසන්තය නැගෙනහිර නවෝදය ඒ9 මාර්ගය අවටට පමණක් සීමාවීම කෙළවර වී ඇත්තේ උතුරේ ජනතාව තව තවත් ආණ්ඩුවෙන් ඉවතට තල්ලුවීම තුළින් ය. පසුගිය දා පැවැත්වූ උතුරේ මැතිවරණයෙන් රජය අත්වින්දේ ඒ ප්‍රතිඵලයයි.

රජය උතුර කෙරෙහි දක්වන සැළකිල්ල පිලිබඳ සරළ උදාහරණයක් ලෙස උතුරු දුම්රිය මාර්ගයට ගත හැකිය දැන් වසර දෙකක් තිස්සේ එහි වැඩ කටයුතු ඕමන්තේ දුම්රිය පොල වෙත පමණක් සීමා ව තිබේ. සියලු වැඩ ඉන් ඔබ්බට යාම නැවතී තිබේ. උතුරු දුම්රිය මාරගය ගොඩනැගීම වෙනුවෙන් ශ්‍රමය මුදල් පරිත්‍යාග කිරීමට සූදානම් ජනතාවක් සිටියදී සුනාමියෙන් විනාශ වූ දුම්රිය මාර්ගය කිලෝ මීටර් 100 කට වැඩි දුරක් දින 58 ක් වැනි කාලයක් තුළ නැවත ප්‍රතිසංස්කරණය කළ දුම්රිය දෙපාර්තමේන්තුවක් ද ඇති රටක් ඒ සියල්ල පසකෙ ලා දුම්රිය මාර්ගය පිලිසකර කිරීම විදේශීය සමාගම්වලට පැවරීමට සූදානම් වී ඇත. ඉන් ලාබ ලබන්නේ කවුරුන්ද යන්න ගැන උතුරේ ජනතාවටය අවබෝධයක් නැත්තේ නොවේ. ඒවා ඉතා සරළ උදාහරණ පමණකි.
උතුරේ ආරක්ෂාව පිළිබඳ වෙම කතිකාවක් තිබේ. ආරක්ෂාව යනු අත්‍යවශ්‍ය කාරණයක් බව සැබැය. කල් පවතින සාමයක් ගොඩ නැගීමට එය එක් සාධකයක් පමණකි. එහෙත් එය යොදාගත යුත්තේ වෙනත් ජාතියක් හෝ සංස්කෘතියක් මත බලහත්කාරය පවත්වමින් නොවේ. අප හා කතා කළ බොහො දෙනෙක් ආරක්ෂාව හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විවිධ අදහස් දැක්වූ ඒ පිළිබඳව එක් වැසියකුගේ අදහස මෙහිලා දැක්වීම වටී.

"මහත්තයෝ මේ දවස් වල නල්ලූර් කෝවිලේ පූජා කාලය. ඒකෙ ආරක්ෂාවට ආරක්ෂක අංශ වල මහත්තුරු දාදාහක් දාලා ඉන්නවා.. දා දාහක්.. ඒත් පහුගිය දවස් තුනට මාල 21 ක් කඩාගෙන පැනලා. කවුද දන්නෙ නෑ. කිසි කෙනෙක් අල්ලගන්න බැරි වුනා. ඒක හරි පුදුම වැඩක්. මාල කඩන් පැනලා යන්නෙ කොහොමද මේ තරම් ආරක්සාවක් තියෙද්දි..?"

ප්‍රශ්න අසන්නේ ඔවුන් ය පිළිතුරු දිය යුත්තේ අප ය.

සංස්කාරක

*ගිය මාසයේ කතු වැකියේ ගායකයාගේ නම ශෙහාන් මිහිරංග නොව සුරේන්ද්‍ර පෙරේරා ලෙස නිවැරදි විය යුතුය. ඒ ප්‍රමාද දෝශය පිළිබඳව අපේ කණගාටුව ප්‍රකාශ කරමු*


